# ශාන්ත පීතර විදුහල - කොළඹ 04

## මධ්‍ය වාර පරීක්ෂණ, පළමු වාරය - 2020

## 08 ශ්‍රේණිය - විද්‍යාව

කාලයඃ පැය 1 1/2

17/02/2020

## I කොටස

**වඩාත්ම නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ක්ෂුද්‍ර ජීවීන් වර්ධනය සඳහා හිතකර උෂ්ණත්ව පරාසය වන්නේ,

   i. $30^{o}$ C - $40^{o}$ C ii. $15^{o}$ C - $25^{o}$ C
   iii. $25^{o}$ C - $30^{o}$ C iv. $45^{o}$ C ට වැඩි

2. ප්‍රෝටීන් බහුල ආහාර මත ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය හඳුන්වන ලබන්නේ,

   i. මුඩු වීම ii. ප්‍රතිභවනය iii. පැසීම iv. ස්වයං වියෝජනය

3. නරක් වූ ආහාරයක් හඳුනාගත හැකි පහසුම ලක්ෂණයක් වන්නේ,

   i. රසය වෙනස් වීම. ii. සුවඳ වෙනස් වීම.
   iii. වර්ණය වෙනස් වීම. iv. ඉහත සියල්ලම

4. 

   ඉහත රූප සටහනේ දක්වා ඇති ක්ෂුද්‍ර ජීවී විශේෂය වන්නේ,

   i. ඇමීබා ii. ක්ලැමිඩමෝනාස් iii. යීස්ට් iv. ලැක්ටොබැසිලස්

5. ජලභීතිකාව සඳහා හේතු වන රෝග කාරකයා වන්නේ,

   i. වෛරස් ii. බැක්ටීරියා iii. දිලීර iv. ප්‍රොටොසෝවා

6. දැල්ලා අයත් සත්ත්ව කාණ්ඩය වන්නේ,

   i. ක්ෂීරපායින් ii. මත්ස්‍යයින් iii. මොලුස්කාවන් iv. ආත්‍රොපෝඩා

7. කශේරුවක් සහිතයි. ශ්වසනයට පෙනහළු යොදාගනී.

   i. රෙප්ටීලියා ii. ඇම්ෆීබියා iii. ආවේස් iv. පිස්කේස්

8. ක්ෂය රෝගය සහ ඩෙංගු රෝගය සඳහා හේතු වන රෝග කාරකයන් වන්නේ,

   i. වෛරස් සහ දිලීර ii. වෛරස් සහ බැක්ටීරියා
   iii. දිලීර සහ වෛරස් iv. බැක්ටීරියා සහ වෛරස්

9. ඓන්ද්‍රිය ද්‍රව්‍ය වියෝජනය සඳහා දායක වන ප්‍රධානතම ක්ෂුද්‍ර ජීවී කාණ්ඩ දෙක වනුයේ

   i. ප්‍රොටෝසෝවා සහ ඇල්ගී ii. බැක්ටීරියා සහ දිලීර
   iii. වෛරස් සහ බැක්ටීරියා iv. බැක්ටීරියා සහ දිලීර

10. කැරපොත්තා සම්බන්ධව නිවැරදි ප්‍රකාශ ඇතුළත් පිළිතුර වන්නේ,

**A** - සන්ධි සහිත උපාංග තිබීම.
**B** - ශ්වසනයට පෙනහළු පිහිටා තිබීම.
**C** - පේෂීමය පාදයක් තිබීම.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,

i. A පමණි ii. B පමණි iii. A හා B පමණි iv. A හා C පමණි

11. 

ඉහත දක්වා ඇති සත්ත්වයා පිළිබඳව ඇති සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

i. පෙනහළු මගින් ශ්වසනය කරයි.
ii. පියෑඹීම මගින් සංචරණය කරයි.
iii. සුවිශේෂී වූ හැඩගැසීම් සහිත පක්ෂියෙකි.
iv. මුඛය වෙනුවට හොටක් පිහිටා නැත.

12. ක්ෂුද්‍ර ජීවීන් දැකිය හැකි ස්ථාන / පරිසර වන්නේ,

i. උණු දිය උල්පත්
ii. ජීව දේහ තුළ
iii. උෂ්ණ කාන්තාර වල
iv. ඉහත සියල්ලම

13. පාන් පෙත්තක් දින කිහිපයක් තැබූ විට දැකිය හැකි නිරීක්ෂණයක් නොවන්නේ,

i. එතිල් මධ්‍යසාර ගන්ධය ඇති වීම.
ii. එහි බාහිර පෙනුම වෙනස් වීම.
iii. කළු පැහැති පුල්ලි වැනි ස්වභාවයක් ඇති වීම.
iv. වයනය නැමති ගුණය වෙනස් වීම.

14. ආහාර කල් තබා ගැනීමේ දී ලුණු දැමීම මගින් සීමා කරන්නේ කුමන සාධකය ද?

i. උෂ්ණත්වය ii. ජලය iii. පෝෂක ප්‍රමාණය iv. ඉහත සියල්ලම

15. මැඩියා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ අඩංගු පිළිතුර වන්නේ,

**A** - අපර ගාත්‍රා පිහිනීම සඳහා අනුවර්තනය වී ඇත.
**B** - කෘමි භක්ෂකයෙකි.
**C** - ශ්වසනය සඳහා පෙනහළු පමණක් භාවිතා වේ.

i. A පමණි
ii. C පමණි
iii. A හා B පමණි
iv. A, B හා C සත්‍යවේ.

**(ලකුණු 2×15=30)**

## II කොටස

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් ප්‍රකාශදනිවැරිදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද, යොදන්න.

i. ක්ෂුද්‍ර ජීවී විශේෂ සියල්ලක්ම මිනිසාට, ශාක හා සතුන්ට හානිදායක වේ. (   )

ii. ලිෂ්මානියාව රෝගය සඳහා රෝග කාරකයා වන්නේ වෛරසයකි. (   )

iii. බේකරි ආශ්‍රිත නිෂ්පාදන සඳහා යීස්ට් නැමති ක්ෂුද්‍ර ජීවීන් බහුලව යොදා ගනී. (   )

iv. බූවල්ලා යනු ආත්‍රෝපෝඩා කාණ්ඩයට අයත් ජීවියෙකි. (   )

v. සතුන් වර්ගීකරණය මගින් ඔවුන් පිළිබඳව අධ්‍යයනය පහසුවේ. (   )

**(ලකුණු 3×5=15)**

02. සුදුසු වචනය යොදා පහත ඡේදය සම්පූර්ණ කරන්න.

මුල් වරට ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණය කරන ලද්දේ ________________ විසිනි. ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණය සඳහා ________________ භාවිතා කරයි. එහෙත් ________________ නිරීක්ෂණය සඳහා ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂය භාවිතා කරයි. ක්ෂුද්‍ර ජීවී වර්ධනයට අත්‍යවශ්‍ය සාධක ලෙස ________________ සහ ________________ දැක්විය හැකිය. **(ලකුණු 3×5=15)**

03.




රූප සටහන ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. ඉහත A ද්‍රවණයේ අඩංගු ද්‍රව්‍ය 2ක් නම් කරන්න.

________________________________________

________________________________________

ii. ඉහත උපකරණ ඇටවුම ටික වේලාවක් තැබූ විට දැකිය හැකි වෙනස්කම් / නිරීෂණ 2ක් ලියන්න.

________________________________________

________________________________________

iii. ඉහත A ද්‍රාවණයේ සිටි ජීවියාගේ ආර්ථික වාසියක් / ප්‍රයෝජනයක් ලියන්න.

________________________________________ **(ලකුණු 2×5=10)**

04. ක්ෂුද්‍ර ජීවීන් මගින් මිනිසාට හිතකර සහ අහිතකර බලපෑම් රාශියක් ඇතිවේ.

i. ක්ෂුද්‍ර ජීවීන් යොදාගනු ලබන ආහාරමය නිෂ්පාදන 2 ක් ලියන්න.

________________________________________

________________________________________

ii. ආහාර නිෂ්පාදනය හැරුණු විට ක්ෂුද්‍ර ජීවීන්ගේ හිතකර බලපෑම් 2ක් ලියන්න.

________________________________________

________________________________________

iii. පහත සඳහන් ක්ෂුද්‍ර ජීවීන් මගින් මිනිසාට ඇති කරනු ලබන රෝගයක් බැගින් සඳහන් කරන්න.

වෛරස් - බැක්ටීරියා -

දිලීර - ප්‍රොටොසෝවා -

iv. රෝග ඇති කිරීමට අමතරව ක්ෂුද්‍ර ජීවීන් මගින් ඇති කරනු ලබන අහිතකර බලපෑම් 2ක් ලියන්න.

________________________________________

________________________________________ **(ලකුණු 1×10=10)**

05. පහත සඳහන් සුවිශේෂී ලක්ෂණ දරණ සත්ත්ව කාණ්ඩය ලියා දක්වන්න.

i. දංශක කෝෂ්ඨ පිහිටා තිබීම - ____________________

ii. සන්ධි සහිත උපාංග පිහිටා තිබීම - ____________________

iii. කොරළ රහිත, ග්‍රන්ථි සහිත තෙත සමක් පිහිටා තිබීම - ____________________

iv. දේහයේ අනාකුල හැඩය සහ කරමල් පිහිටා තිබීම - ____________________

v. රූපාන්තරණයක් පෙන්වීම සහ ශ්වසනයට පෙනහළු හා තෙත සම යොදාගැනීම - ____________________ **(ලකුණු 2×5=10)**

06. පහත දක්වා ඇති රූප දටහන ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



i. ඉහත රූප සටහනේ දැක්වෙන ජීවියා නම් කරන්න.

________________________________________

ii. එම ජීවියා අයත් කාණ්ඩය කුමක් ද?

________________________________________

iii. මෙම ජීවියාගේ සමමිතිය පිළිබඳව කුමක් කිව හැකිද?

________________________________________

iv. මෙම ජීවියාගේ සුවිශේෂී ලක්ෂණ 2ක් සඳහන් කරන්න.

________________________________________

________________________________________ **(ලකුණු 2×5=10)**